18673

OL/2009/14-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

කතෝලික ධර්මය I,II
கத்தோலிக்கத் திரு மறை I,II
**Catholicism I,II**

පැය තුනයි
மூன்று மணித்தியாலங்கள்
*Three hours*

## කතෝලික ධර්මය I

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

(v) **I හා II පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දෙන්න.**

1. මිනිසා දෙවියන්වහන්සේ අත්දකිනුයේ
   (1) ස්වභාවික විපත් තුළින් ය.
   (2) සරුසාර අස්වැන්නක් ලැබීමෙන් ය.
   (3) භෞතික ලෝකය හා තම ජිවිතය තුළින් ය.
   (4) ශුද්ධ ලියවිල්ල තුළින් ය.

2. දෙවියන්වහන්සේ මිනිසා සහ මුළු මැවිල්ල මවන ලද්දේ
   (1) දේව ආධිපත්‍යය ලෝ පුරා පැතිරවීම සඳහා ය.
   (2) මිනිසාට සතුටින් ජීවත් වීම සඳහා ය.
   (3) ලොව ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම සඳහා ය.
   (4) දෙවියන්වහන්සේගේ අයිමිත ප්‍රේමය සඳහා ය.

3. දේව අනාවරණයේ අරමුණ වනුයේ
   (1) ක්‍රිස්තුන් වහන්සේ මගින් දෙවියන්වහන්සේව හමුවීම ය.
   (2) දෙවියන්වහන්සේගේ වැඩ සිටීම ප්‍රකාශ කිරීම ය.
   (3) දෙවියන්වහන්සේට වන්දනා කළ යුතු බව ඉගැන්වීම ය.
   (4) ශුද්ධ ලියවිල්ල කියවීමට පෙළඹවීම ය.

4. පාසල් සිසුවෙක් ජේසුන් වහන්සේගේ මාංශගතවීම විස්තර කළ අයුරු මෙසේ ය.
   A - නැතිවීගිය දේව සැබැඳියාව නැවත ඇති කිරීමට ය.
   B - මිනිසා උසස් තත්ත්වයකට පත් කිරීමට ය.
   C - දෙවියන්වහන්සේගේ ම වචනයෙන් මිනිසාට කථා කිරීමට ය.
   D - දෙවියන්වහන්සේගේ වචනය ලොවට ප්‍රකාශ කිරීමට ය.
   
   මෙම කරුණු වලින් නිවැරදි වනුයේ
   (1) A, B ය. (2) B, D ය. (3) C, D ය. (4) A, B, C, D ය.

5. ජේසුන් වහන්සේ ගේ ධර්ම දූත කාර්යයේ උච්චතම අවස්ථාව වනුයේ
   (1) පන්දහසකට කෑම දීම ය.
   (2) දේව මාලිගාවේ පඬිවරුන් මැද දේශනා කිරීම ය.
   (3) ගෝලයින් තෝරා ගැනීම ය.
   (4) දුක් විඳීම, මරණය සහ උත්ථානය ය.

[ දෙවැනි පිටුව බලන්න.

6. ජීවිතයේ දුක්කම්කටොලු රාශියකට මැදිවී ජීවත් වන සිමියොන් මාමා තම ජීවිත වේදනාවන් ගැන මෙලෙස ප්‍රකාශ කළේ ය. කිතුනුවෙක් ලෙස ඔබ සිමියොන් මාමාට තෝරා දෙන්නේ කුමන ප්‍රකාශය ද?
   (1) "මෙයට වඩා හොඳයි මැරිලා ගියා නම්" (2) "මේ හැටි දුක් විඳිම මහා පවුකාර කමක්"
   (3) "මේක මහා දේව සාපයක්" (4) "මේ හැම කදරයකම දේව පණිවිඩයක් ඇත."

7. පාස්කු අභිරහස යනුවෙන් හැඳින්වුයේ
   (1) ජේසුන් වහන්සේගේ උපත, මරණය හා උත්ථානය වේ.
   (2) ජේසුන් වහන්සේගේ උපත, මරණය හා පුණර්ජීවනය වේ.
   (3) ජේසුන් වහන්සේගේ උපත, ජනතාවගෙන් ප්‍රතික්ෂේප කරනු ලැබීම හා මරණය වේ.
   (4) ජේසුන් වහ්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය වේ.

8. යුද්ධයට මැදි වූ දහම් ගුරුවරයෙක් ප්‍රකාශ කළේ, "යුධ සමයේ දී අප ආරක්ෂා වූයේ දේව සංරක්ෂණයෙනි." මෙම කියමනින් සනාථ වනුයේ
   (1) පැරණි ගිවිසුමේ නික්ම යාමේ කථාව සත්‍ය බව ය.
   (2) ඔවුන් දෙවියන්වහන්සේ කෙරෙහි තිබූ ගැඹුරු විශ්වාසය ය.
   (3) දෙවියන්වහන්සේ සර්ව බලධාරී බව ය.
   (4) දිව්‍යපිවරුන්ගේ ඉගැන්වීම්වල හරය ය.

9. ආරම්භක ප්‍රසාද නිධාන මගින් තමන්ගේ ජීවිතයට උරුම වන වරප්‍රසාද ගැන සිසුවෙක් ප්‍රකාශ කළේ පහත සඳහන් ආකාරයටය. ඉන් නිවැරදි වන්නේ
   (1) දේව දරුකම, ශුද්ධාත්ම බලය, දිව්‍ය පෝෂණය
   (2) විශ්වාසය, ප්‍රේමය හා දයාව
   (3) ප්‍රේමය, බලාපොරොත්තුව හා ඉවසිලිවන්ත කම
   (4) දේව දරුකම, අන් අය සමග සමගිවීම හා ගුණයහපත් කම

10. ක්‍රිස්තියානි ජීවිතය වර්ධනය වී පළදරීමට නම් අඛණ්ඩවම ........................................ .
    හිස්තැනට යෝග්‍ය යෙදුම තෝරන්න.
   (1) සභාව තුළ ක්‍රියාකාරී විය යුතු ය.
   (2) සක්‍රමේන්තු ලබා ගත යුතු ය.
   (3) අසරණ දුගීන් වෙත දයා සේවාවේ නිරත විය යුතු ය.
   (4) ශුද්ධ බයිබලය කියවිය යුතු ය.

11. "ස්වාමීනි, ඔබවහන්සේ මා හද තුළ නතර වුව මැනව." මෙය මීසමේ ළමා රැලියේ තේමාව විය. එය චරිතායනය කර ගැනීමට එක්තරා පාසල් සිසුවෙක් කළ ක්‍රියාකාරකම් කිහිපයක් පහත සඳහන් වේ. නිවැරදි ක්‍රියාකාරකම වන්නේ
   (1) ශුද්ධ ලියවිල්ල නිතර නිතර කියවීම ය.
   (2) ධර්ම දූත ළමා සමාජයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් වීම ය.
   (3) ඉරුදින දිව්‍ය පූජාවට අර්ථවත් ව සහභාගී වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම ය.
   (4) දහම් පාසලේ බයිබල් පාඩමට සහභාගි වීම ය.

12. සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය පිළිබඳ ව කළ සාකච්ඡාවෙන් මතු වූ අදහස් හතරක් පහත සඳහන් වේ. ඒවායින් වඩාත් නිවැරදි අදහස ලෙස සැලකිය හැක්කේ
   (1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට සූදනම් කරයි.
   (2) අන් අය ඇසුරු කිරීමට පොළඹවයි.
   (3) ඇතුලාන්ත සිත් හැරීමක් තුළින් ජීවිතය වෙනස් කරයි.
   (4) පව්වලට සමාව ලබයි.

13. "මිනිසා තනිව විසීම සුදුසු නැත. ඔහුට සුදුසු සහකාරියක් මවා දෙන්නෙමි"යි වදාළ සේක. (උත් 2 : 18)
    මෙම කියමනින් අදහස් කළේ
   (1) මිනිසා තනිව සිටිය යුතු නැති බව ය.
   (2) සෑම මිනිසෙකුටම සහකාරියක් සිටිය යුතු බව ය.
   (3) මිනිසා සමාජීය ජීවිතයට කැඳවා ඇති බව ය.
   (4) මිනිසාට විවාහය අනිවාර්ය බව ය.

[ තුන්වැනි පිටුව බලන්න.

14. පැවිදි ජීවිතය පිළිබඳ පාඩමේ සාකච්ඡාවේ දී ළමුන්ගේ ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ
(1) පැවිදිවරයෙක් යනු ක්‍රිස්තුන් වහන්සේගේ සාක්ෂි කරුවකු ලෙස ජනතාවට සේවය කිරීම සඳහා කැපවූ කෙනෙකි.
(2) පැවිදිවරයෙක් යනු ශ්‍රේෂ්ඨයන්ට කීකරුව ජීවත් වන්නකි.
(3) පැවිදිවරයෙක් යනු පැවිදි නිකාය තුළ සාංඝිකත්වය අත්දකින්නෙකි.
(4) පැවිදිවරයෙක් යනු ඉහත සඳහන් සැම කරුණක්ම පිළිපදින්නෙකි.

15. කිතුනු ගිහියාට තම දූත සේවය කිරීමේ වගකීම ලැබී ඇත්තේ
(1) ඔවුන් ලබන දිව්‍ය සත්ප්‍රසාදයේ සක්‍රමේන්තුව මගිනි.
(2) ඔවුන්ගේ සමාජීය ස්ථාවරය මගිනි.
(3) ඔවුන්ගේ ප්‍රසාද ස්නාපනයෙන් උරුමකරගත් බලයෙනි.
(4) ඔවුන්ගේ ආත්ම විශ්වාසය හේතුවෙනි.

16. වසර 30 ක් පුරා මීයමේ මරිය හමුදුවේ ප්‍රබල සාමාජිකාවක් වූ මාග්‍රට් නැන්දට මීයමේ පියතුමා ඉරුදින දිව්‍ය පූජාවෙන් පසු විශේෂ උපහාරයක් දක්වන ලදී. පියතුමා එම උපහාරය තුළින් සිදුකළේ,
(1) ගිහි ධර්මදූත සේවය ඇගයීම ය. (2) මරිය හමුද සේවය ගැන ජනතාව දැනුවත් කිරීම ය.
(3) දේව කැඳවීම් වලට දරුවන් පෙළඹවීම ය. (4) මරිය හටයින් වැඩිකර ගැනීමට උත්සාහ කිරීම ය.

17. ජන වන්දනාවේ ප්‍රධාන අංගයන් වනුයේ
(1) දිව්‍ය පූජාව, සක්‍රමේන්තු, යාම යැදුම් ය.
(2) දිව්‍ය පූජාව, සුව මෙහෙය, යාම යැදුම් ය.
(3) දේව වාක්‍යයේ කොටස, පඬුරු පිදීම, විස්වාසිතයින්ගේ යැදුම් ය.
(4) යාම යැදුම්, පඬුරු පිදීම, ජපමාලය උච්චාරණය කිරීම ය.

18. ගිහියා පමණක් දනය කරන සක්‍රමේන්තුව වනුයේ,
(1) රෝගීන්ගේ ආලේපය ය. (2) දිව්‍ය සත්ප්‍රසාදය ය.
(3) ආශිර්වාදකාර බන්ධනය ය. (4) ප්‍රසාද ස්නාපන ය.

19. නව ගිවිසුමේ අග්‍ර පූජකයා වනුයේ
(1) මෙල්කිසදෙක් ය. (2) සකරියස් ය.
(3) ස්නාවක ජුවාම් ය. (4) ජේසුන් ක්‍රිස්තුන් වහන්සේ ය.

20. ශු. පාවුළු තුමා කිතුනු පවුල තුළ ඇති ප්‍රේමයේ බන්ධනය සමාන කර ඇත්තේ
(1) ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධයට ය.
(2) අත්ත මිදිවැලට යාවී ඇති අන්දමට ය.
(3) පොළොවේ ලුනු හා ලෝකයේ ආලෝකයට ය.
(4) අන්ධකාරය හා ආලෝකය අතර ඇති සම්බන්ධයට ය.

21. පේදුරු තුමාගේ මහා ප්‍රබල දේශනයට පොළඹවනු ලැබුවේ
(1) සභාවට නායකත්වය දිය යුතුය යන අධිෂ්ඨානය ය.
(2) ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම ය.
(3) ජේසුන් වහන්සේ ගේ බලවත් ඉල්ලීමය ය.
(4) සෙසු ගෝලයින්ට ආදර්ශයක් පෙන්වීමට ය.

22. මිනිස් කමට ගරු කිරීමට නම් ........................... අනුව ජීවත් විය යුතු ය. හිස්තැනට සුදුසු යෙදුම වනුයේ
(1) දේව දීමනාවලට (2) දේව ප්‍රේමයට (3) හෘදයසාක්ෂියට (4) දේව පනත්වලට

23. සත්‍යවාදීව ජීවත් වෙමින් සත්‍යයට සාක්ෂි දැරීමට හැකි වනුයේ
(1) සත්‍යයට විරුද්ධව ඇති ක්‍රියාවලින් වැළකීමෙනි.
(2) අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීමෙන් වැළකීමෙනි.
(3) කටකතා ප්‍රචාරය කිරීමෙන් වැළකීමෙනි.
(4) අවස්ථාවාදීව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කිරීමෙනි.



[ හතරවැනි පිටුව බලන්න.

24. යාච්ඤාව ජීවිතයට ඒකාබද්ධ කර ගැනීමෙන්
(1) දේව කැමැත්තට අනුව තම වගකීම් ඉටුකිරීමට ධෛර්ය ලැබේ.
(2) ජීවිත බර සැහැල්ලු කර ගැනීමට හැකි වේ.
(3) අන් අයට ප්‍රිය මනාපව ජීවත් විය හැකි වේ.
(4) දේව ආදරය තමන්ට උරුමකර ගත හැකි වේ.

25. කතෝලික සිසුවෙක් අන්‍යාගමික මිතුරෙකුට දිව්‍ය පූජාව ගැන හඳුන්වා දීමේ දී කරන ලද **නිවැරදි** ම ප්‍රකාශය වන්නේ
(1) එය මුල් කිතුනු සංඝයේ එකතුව වර්තමානයට ගෙන ඒම ය.
(2) එය ජනතාව එකතු කර වන්දනා කරන පිළිවෙතක් ය.
(3) එය කල්වාරි යාගය වර්තමානයට ගෙන ඒම ය.
(4) එය පවුරු එකතු කිරීමේ පිළිවෙත ය.

26. දෙවියන්වහන්සේ සමග ගැඹුරු සම්බන්දතාවයක් පැවතීමේ වටිනාකම පෙන්වමින් ජේසුන් වහන්සේ වදාළ උපමාව වන්නේ
(1) වපුරන්නාගේ උපමාව ය.
(2) නැතිවූ කාසියේ උපමාව ය.
(3) මිදිවැල සහ අතු පිළිබඳ උපමාව ය.
(4) නැතිවූ බැටලුවා පිළිබඳ උපමාව ය.

27. මහා මංගල දේශනය තුළින් ජේසුන් වහන්සේ ඉගැන්වූයේ
(1) ඉතා සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීමේ ක්‍රමය ය.
(2) සතුටින් ජීවත් වන මාර්ගය ය.
(3) ජීවිතයේ සැප සම්පත් මෙලොවදී උරුම කර ගන්නා අයුරු ය.
(4) ක්‍රිස්තු අනුගාමිකයා භාග්‍යවත් ජීවිතයක් උරුමකරගන්නා මාර්ගය ය.

28. ස්වර්ග රාජ්‍යය උරුම වනුයේ
(1) බොරු නොකියන අයට ය.
(2) දිනපතා යාච්ඤා කරන අයට ය.
(3) යුක්තිය උදෙසා පීඩා විඳින අයට ය.
(4) තැන්පත්ව සිටින අයට ය.

29. දෙවියන් වහන්සේ විසින් දස පනත දනය කිරීමේ අරමුණ වූයේ
(1) මිනිසාගේ දරදඬු කමට දඬුවම් දී යහ මග යැවීමට ය.
(2) මිනිසාගේ උතුම් කම ආරක්ෂාවන ලෙස ජීවත් වීමට පුරුදු පුහුණු කිරීමට ය.
(3) මිනිසාගේ වැරදි අවබෝධ කර ගැනීමට පෙළඹවීම සඳහා ය.
(4) දෙවියන්වහන්සේගේ බලය තහවුරු කිරීම සඳහා ය.

30. පැරණි ගිවිසුම් නීතිය ඉටු කළ පමණින් මිනිසාගේ ධර්මිෂ්ඨකම සම්පූර්ණ නොවන බව ජේසුන් වහන්සේ ප්‍රකාශ කළේ
(1) රෝම ශතාධිපතියාට ය.
(2) පරිසිවරුනට ය.
(3) පේදුරු ගෝලයාට ය.
(4) ධනවත් තරුණයාට ය.

31. සියදිවි නැති කර ගැනීම තුළින් යමෙක් කරන බරපතලම වරද වනුයේ
(1) ජීවිතයේ හිමිකරු වූ දෙවියන්වහන්සේගේ අයිතිය උදුරා ගැනීම ය.
(2) ජීවිත අභියෝගවලට එඩිතරව මුහුණ නොදීම ය.
(3) ජීවිතයේ වටිනාකම අවතක්සේරු කිරීම ය.
(4) තමා ජීවත්වන මිනිස් සමාජය ප්‍රතික්ෂේප කිරීම ය.

32. දේව රාජ්‍යයේ පදනම වනුයේ
(1) විශ්වාසය, ප්‍රඥාව හා දේව ප්‍රේමය ය.
(2) බලාපොරොත්තුව, දේව ප්‍රේමය හා සමාව දීම ය.
(3) දේව ප්‍රේමය, විශ්වාසය හා බැහැපත් කම ය.
(4) විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය ය.

33. කිතුනු ජීවිතයේ අවසාන බලාපොරොත්තුව වනුයේ
(1) දේව අභිමුවට පිවිසීම ය.
(2) තම යුතුකම් කොටස හරියාකාරව නිම කිරීම ය.
(3) තම දරුවන්ට හොඳින් හම්බකර තැබීම ය.
(4) සුභ මරණයක් ලැබීම ය.

[ පස්වැනි පිටුව බලන්න.

34. "උතුරේ කඳවුරුවල අවතැන්වූ ළමුන් සඳහා පාසල් පොත් ලබා දෙමුයි" 11 පන්තියේ නායක සියුවා යෝජනා කර සැලසුම් කළේ ය. ඔහු ක්‍රියාවට නගා ඇත්තේ ..................... භාග්‍යය වන්තයෝය යන ජේසුන් වහන්සේගේ ඉගැන්වීම ය. හිස් තැනට සුදුසු වනුයේ

(1) නිහතමානී ගුණ ඇත්තෝ (2) දයාවන්තයෝ

(3) සාමය ඇති කරන්නෝ (4) නිර්මල සිත් ඇත්තෝ

35. තමාගේ ගොවිපලේ අස්වැන්න ගැන ලතවෙමින් යාබද කුඹුරේ සාර්ථකත්වය දෙස බලමින් සුසුම් හෙලන ගොවි මහතා කඩ කර ඇත්තේ

(1) අන් වස්තු ආශා නොකරව යන ඉගැන්වීම ය.
(2) සොරකම් නොකරව යන ඉගැන්වීම ය.
(3) සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝය යන ඉගැන්වීම ය.
(4) උත්සහවන්තයා ජයගනී යන ඉගැන්වීම ය.

36. "බැගෑ සිතින් දෙව්සරණ පතන්නෝ භාග්‍යවන්තයෝය." මෙම ඉගැන්වීම පිළිපදින්නන් ලෙස හඳුන්වනුයේ

(1) දේව විශ්වාසයෙන් එඩිතරව කතා කරන්නන් ය.
(2) සුභාරංචිය අසා ඒ අනුව යහපත් ජීවිතයක් ගත කරන්නන් ය.
(3) මීසම් සභාවල නායකත්වය ගෙන කටයුතු කරන්නන් ය.
(4) සෑම අවස්ථාවලදීම දේව සංරක්ෂණය තුළ යැපෙන්නන් ය.

37. මංගල්‍ය සමයේ ජන වන්දනා සැලැස්මට මීසම්පති පියතුමා පශ්චත්තාපික දිනයක් ලෙස එක් දවසක් වෙන්කරන ලදී. එදින දනය කරන ලද සක්‍රමේන්තුව තුළින් මීසම් ජනතාව ලබා ගත් වරප්‍රසාදය වනුයේ,

(1) පාපවලට ක්ෂමාවයි. (2) ඇතුලාන්ත සිත් සාමයයි.

(3) නැවත පව් නොකිරීමට ශක්තියයි. (4) පව් සමාව හා ආධ්‍යාත්මික සුවයයි.

38. සමගි සංධානයේ සක්‍රමේන්තුව ලැබීමේ වඩාත් නිවැරදි පිළිවෙළ වනුයේ

(1) පව් නොකිරීමට අධිෂ්ඨානය, පව් සිහිකිරීම, පසුතැවීම, පියතුමාට පව් කීම, සුවය ලැබීම
(2) සුවය ලැබීම, පව් සිහිකිරීම, පව් නොකිරීමට අධිෂ්ඨානය, පියතුමාට පව් කීම, පව්වලට මනස්තාපය
(3) පව් සිහිකිරීම, පසුතැවීම, මින් මතු පව් නොකිරීමට අධිෂ්ඨානය, පියතුමාට පව් කීම, සිත් සාමය ලැබීම
(4) සිත් සාමය, පියතුමාට පව් කීම, පව් නොකිරීමට අධිෂ්ඨානය, මනස්ථාපය, පව් සිහිකිරීම

39. නොමග ගිය වැඩිහිටියෙක් මීසමේ පියතුමා හමුවී තමන්ගේ අතීත ජීවිතය ගැන කතා කළේ ය. එම අවස්ථාවේ දී ඔහු පෙන්වාදුන් ආකාරයට ඔහුට යහපත හා අයහපත අතර ඇති වෙනස වටහා ගැනීමට උපකාර වූයේ

(1) ජනමාධ්‍ය ප්‍රකාශන, අසල්වාසීන් හා වැඩිහිටියන් ය.
(2) භාග්‍යය අට, යහළුවන් හා දෙමාපියන් ය.
(3) හෘදසාක්ෂිය, දසපනත හා භාග්‍ය අට ය.
(4) යහළුවන්, අවට සිද්ධීන් හා නීති රීති ය.

40. නූතන ලෝකය තුළ අප ක්‍රියාකාරී විය යුත්තේ

(1) ශ්‍රේෂ්ඨයන් වීමට ය. (2) හොඳ නම ආරක්ෂා කර ගැනීමට ය.

(3) ධනය හා බලය උපයා ගැනීමට ය. (4) ස්වාමින් වහන්සේට සාක්ෂි දැරීමට ය.

* *

[ හයවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

## කතෝලික ධර්මය II

※ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. (i) ආදි පිතෘ ආබ්‍රහම්ගේ ජීවිතයේ පිළිබිඹු වූ විශේෂිත ලක්ෂණය කුමක් ද?
   (ii) පූජකවරයේ සක්‍රමේන්තුව දනය කිරීමේ පිළිවෙත තුළ දකිය හැකි ප්‍රධාන අංග දෙකක් ලියන්න.
   (iii) දෙවියන්වහන්සේ මිනිසාට අනාවරණය වූ ආකාර දෙකක් ලියන්න.
   (iv) ආශිර්වාදකාර බන්ධනයේ ස්ථිරත්වය ගැන ජේසුන් වහන්සේගේ ඉගැන්වීම කුමක් ද?
   (v) ප්‍රසාද ස්නාපනයේ සක්‍රමේන්තුව මගින් ලැබෙන පොදු පූජකවරය තුළින් පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.
   (vi) පව් කමාවේ සක්‍රමේන්තුව තුළින් දෙවියන්වහන්සේ වෙත නැවත හැරී ඒමේ දී අවශ්‍ය වන මූලික කරුණු දෙකක් ලියන්න.
   (vii) ශුද්ධවූ සභාවේ පනත් දෙකක් ලියන්න.
   (viii) අසාධාරණ ලෙස හොර බඩු මුදල් ගෙවා ලබා ගෙන සහවා තබා ගැනීමෙන් කඩ කරන පනත් දෙකක් ලියන්න.
   (ix) භාවනා කිරීමේ දී අත්‍යවශ්‍ය සාධකය කුමක් ද?
   (x) බර්නබස් සහ සාවුල් ධර්ම දූත සේවාවට පිටත් කිරීමට පෙර අපෝස්තුළුවරුන් කුමක් කළේ ද? කරුණු දෙකක් ලියන්න. *(ලකුණු 2 × 10 = 20 යි)*

2. (i) උත්පත්ති පොතේ සඳහන් පරිදි මිනිසා මැවීමේ කථා දෙක නම් කරන්න.
   (ii) ආදම් සහ ඒව දෙවියන්වහන්සේට පිටු පෑ නිසා අහිමි කරගත් වරප්‍රසාද **තුනක්** ලියන්න.
   (iii) දේව මැවිල්ලක් වන ඔබ, සමාජයට ඉටුකරන කාර්යයන් **පහක් වචන 75 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

3. (i) ශුද්ධාත්ම ඵල දෙකක් ලියන්න.
   (ii) අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීමේ සිද්ධිය කෙටියෙන් ලියන්න.
   (iii) මුල් කිතුනු සමාජය තුළ සමාජ නවෝදයක් ඇති වීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ ගේ පැමිණීම බලපෑ අයුරු සනාථ කිරීමට කරුණු **පහක් වචන 75 කින්** පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

4. (i) ක්‍රිස්තුන් වහන්සේ විසින් මහා බ්‍රහස්පතින්ද දින ස්ථාපිත කළ සක්‍රමේන්තු දෙක කුමක් ද?
   (ii) සත්ප්‍රසාද ලැබීමෙන් පසු උච්චාරණය කිරීමට සුදුසු තුති පිදීමේ යැදුමක් කෙටියෙන් ලියන්න.
   (iii) නිල පූජකවරය තුළින් මීසම භාර පූජාප්‍රසාදීතුමාට මීසම තුළ ඉටු කිරීමට පැවරී ඇති කාර්ය භාරයන් **පහක්** විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

5. (i) ස්වාමිවාක් ආරාධනාවේ සුවිශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.
   (ii) ජුවාම් 17 පරිච්ඡේදයේ සඳහන් උත්තම පූජක යාච්ඤාවේ මූලික ලක්ෂණ **තුනක්** ලියන්න.
   (iii) නිරන්තර යාච්ඤාවේ වැදගත්කම පෙන්වා දුන් ක්‍රිස්තු ඉගැන්වීම් අනුව යාච්ඤාව ඔබගේ දෛනික ජීවිත අංගයක් කර ගන්නා අයුරු කරුණු **පහකින්** පෙන්වා දෙන්න. *(ලකුණු 10 යි)*

[ හත්වැනි පිටුව බලන්න.

6. (i) කිතුනු පවුල පූර්ණත්වයට පත් කිරීම සඳහා දෙවියන්වහන්සේ විසින් පවරන ලද මූලික කාර්යයන් **දෙකක්** ලියන්න.

(ii) පවුල සමාජයේ උතුම්ම ඒකකය වීමට බලපාන හේතු සාධක **තුනක්** ලියන්න.

(iii) ඔබේ නිවස ක්‍රිස්තු රාජාණන් වැඩ වසන ගෘහයක් කර ගැනීමේ දී පහත සඳහන් අවස්ථාවල ඔබ ක්‍රියා කළ යුතු ආකාරය කෙටියෙන් ලියන්න.

(අ) සවස් කාලයේ පවුල් ජපමාලය උච්චාරණය කිරීමට සූදානම් වීමේ දී රූපවාහිනිය නැරඹීමට පෙලඹීම.

(ආ) පාඩම් කිරීමට සූදානම් වන විට ජංගම දුරකථනයෙන් ඇමතීමක් ලැබීම

(ඉ) ඔබේ සහෝදරයෙක් අසභ්‍ය වචනයෙන් ඔබට බැන වදින විට

(ඊ) පවුලේ සියලු දෙනා එකට ආහාර ගන්නා විට, එක් සාමාජිකයෙක් නිරන්තරයෙන් ම ප්‍රමාද වීම

(උ) මුලු පවුලේ පරිහරණයට ඇති මුදල් සහ දේපොළ පවුලේ එක් සාමාජිකයකු අනිසි ලෙස හා ආත්මාර්ථකාමී ලෙස නාස්ති කරන විට *(ලකුණු 10 යි)*

7. පහත සඳහන් මාතෘකා **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මැක්ෂි මිලියන් කෝල්බේ මුනිඳුන්ගේ මානව දයාව

(ii) මැවිල්ලට නොව මැවුම්කරුවාණන්ට වන්දනා කිරීම

(iii) මෝසෙස්ගේ කැඳවීම හා කාර්යභාරය

(iv) පැවිදි ජීවිතය

(v) රෝගීන්ගේ ආලේපනයේ ආධ්‍යාත්මික සුවය. *(ලකුණු 10 යි)*

※ ※ ※